# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAANS

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIV YEAR OF OUR LORD JESUS CHRIST, FEBRUARY 2020 Issue No. 6


## ශුද්ධවූ බයිබලය (ගීතාවලිය 20:1-9)

1. විපත්ති දවසේදී ස්වාමීන්වහන්සේ නුඹට උත්තරදෙනසේක්වා, යාකෝබ්ගේ දෙවියන්වහන්සේගේ නාමය නුඹ උසස්කෙරේවා, .
2. ශුද්ධස්ථානයෙන් නුඹට පිහිට එවනසේක්වා. සියොන්හි සිට නුඹ ශක්තිමත්කරනසේක්වා,
3. නුඹේ පූජා සියල්ල සිහිකරන සේක්වා, නුඹේ දවන පූජා පිළිගන්නාසේක්වා,
4. නුඹේ සිතේ ආශාව ලෙස නුඹට දෙනසේක්වා, නුඹේ මන්ත්‍රණ සියල්ල ඉෂ්ඨකරනසේක්වා.
5. නුඹේ ගැලවීම ගැන අපි ජය ඝෝෂා කරන්නෙමුව, අපේ දෙවියන්වහන්සේගේ නමින් අපගේ කොඩි නගන්නෙමුව. ස්වාමීන්වහන්සේ නුඹේ සියලු ඉල්ලීම් ඉෂ්ඨකරනසේක්වා.
6. ස්වාමීන්වහන්සේ තමන් අභිෂේකලත් තැනැත්තා ගළවන බව දැන් දනිමි, උන්වහන්සේ තමන් ශුද්ධවූ ස්වර්ගයේ සිට තමන් දකුණතේ ගැළවීමේ ශක්තියෙන් ඔහුට උත්තරදෙන සේක.
7. සමහරු රථ කෙරෙහිද සමහරු අශ්වයන් කෙරෙහිද විශ්වාස කෙරෙති. නමුත් අපි අපේ දෙවිවූ ස්වාමීන්ගේ නාමය සැඳහන් කරන්නෙමුව.
8. ඔව්හු නැමී වැටී සිටිති. නුමුත් අපි නැගිට කෙළින් සිටිමුව.
9. ස්වාමීනි ගැළවුව මැනව. අප හඬගසන කල රජ්ජුරුවෝ අපට උත්තරදෙනසේක්වා.

## ඔබගේ අනාගතය ඔබම සිතා ගන්න

*''...නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේට ප්‍රේමකොට උන්වහන්සේගේ හඬට කීකරු වී උන්වහන්සේට ඇලුම්ව සිටපන්න. මක්නිසාද නුඹේ ජීවනයත්, නුඹේ දවස්වල වැඩිවීමත් එයයයි කීවේය'' (ද්විතීය කථාව 30:20)*

අද බොහෝ මනුෂ්‍යයන් තමාගේ ජීවිතයට කිසිදු ලෙඩ රෝගයක් නොමැතිව දිගු කාලයක් ජීවත් වීමට අවශ්‍යයි කියා ආශා වෙමින් ඒ උදෙසා බොහෝ කැප කිරීම් කරනු ඇත. මෙම උත්සාහ දැරීම් වලින් සමහර පුද්ගලයින් ජයග්‍රහණය ලබන අතර තවත් සමහරු පරාජයට පත්වෙනු ඇත. යමෙක් මේ ලෝකයේ දී තමා අශා කරන්නාවූ දේ අත්පත් කරගන්නට ඕනි නම්, ඔහුට දෙවියන්වහන්සේගේ කරුණාවත් දයාවත් අත්‍යාවශ්‍ය වෙනු ඇත.

දෙවියන්වහන්සේව ඉතා තරයේම විශ්වාස කළ අයට උන්වහන්සේ බොහෝ යහපත් වූ දේ කර තිබේ. වර්තමානයේ දී අප විදුලිය විවිධාකාර ලෙස පාවිච්චි කරනු ලබයි. එනම්, විවිධාකාරයේ විදුලි බුබුළු, රථවාහන, මෝටර්සයිකල්, අහස්යානා, දුම්රියන්, ඔරලෝසු, කැමරා ආදී නවීන උපකරණ අද මනුෂ්‍යාට පාවිච්චි කිරීම සඳහා තිබේ. මේ සියල්ලේම පිටුපස සිටින්නාවූ නිර්මාතෘ දෙවියන්වහන්සේ බව දැනගත් විට ඔබ පුදුමයට පත්වෙනු ඇත. දෙවියන්වහන්සේව නොදන්නා වූ අයට මැවුම්කාර ස්වාමීන්වහන්සේගේ මැවීම භුක්ති විඳීමට නොහැකිය. නමුත් ස්වාමීන්වහන්සේ දන්නාවූ අපිව මැවිල්ලේ ප්‍රතිඵල භුක්ති විඳීමට හැකිය.

මේ වසරේදී ස්වාමීන්වහන්සේට ඔබගේ ජීවිතයෙහි අලුත් දෙයක් කිරීමට හැකියාව ඇත. අප ඉර, සඳ, එළිය, සුළඟ, වර්ෂාව ආදී දේ පොදුවේ භුක්ති විඳිනවාක් මෙන්ම දෙවියන්වහන්සේගේ සැලසුම් හා ප්‍රතිලාභ අප සියලුදෙනාටම පොදුය. උන්වහන්සේ පක්ෂපාතී දෙවි කෙනෙකු නොවෙයි. *(එපීස 6:9)* දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සැලසුම ඔබට එළිදරව් කරමින් ඒ තුළින් උන්වහන්සේ ඔබට ආශිර්වාද කිරීමට කැමතිය. අපගේ දෙවියන්වහන්සේ කසළගොඩින් දිළින්දාව උසස් කරන සේක. *(1 සාමුවෙල් 2 : 8)* ඔබගේ ජීවිතයේ සෑමදේම අහිමි වී

*3 වෙනි පිටුවට ...*

*Touching lives by Teaching ....... Since 1969*

# කැඳවීමේ ප්‍රතිරාවය

**"ස්වාමීන්වහන්සේ ඔබට බොහෝ දේ යහපත පිණිස වැඩිකර දෙනසේක.**
**(ද්වීතිය කථාව 28:11)**



**ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රිය සහෝදර සහෝදරිය,**
**ස්වාමි යේසුස්වහන්සේගේ උතුම් නාමයෙන් අපි ඔබට සුභ පතමු.**

ස්වාමීන්වහන්සේගේ සුභාරංචිය කරණකොටගෙන අපගේ සේවය හරහා බොහෝ අයට උන්වහන්සේ ආශිර්වාද කල නිසා අපි ඉතා සතුටු වෙමු. අපගේ සඟරාව කියවා අපට නන් අයුරින් උපකාර කලාවු අයට අපගේ සතුට ප්‍රකාශ කරමු.

ඔබ දන්නා පරිදි 2019 දෙසැම්බර් මස 01 වන දින සිට 31 වන දින දක්වා අපගේ ස්වාමීවූ දෙවියන්වහන්සේගේ අනර්ඝ පණිවිඩය සියලුදෙනාටම දීමට හැකිවීම ගැනද අපි සතුටු වෙමු. ස්වාමීන්වහන්සේ අපගේ දර්ශනයන් හා සියලු සේවාවන් ඉදිරියටම කරගෙන යෑමට සියලු ආකාර උදවු උපකාර කලාවූ අයටද අපගේ ස්තුතිය පුද කරමු.

ඔබ අපට එවන ලද ලිපි, විද්‍යුත් තැපැල්, කෙටි පණිවුඩ, Whatsapp පණිඩිව ආදී දේ තුලින්ද අපි ආශිර්වාද ලැබීය.

අපගේ යාච්ඤා කණ්ඩායමටද අප ස්තුතිවන්ත වන අතර අපගේ කැඳවීමේ ප්‍රතිරාවයේ යාච්ඤා කණ්ඩායම් යාච්ඤාවන් කරණකොටගෙන බොහෝ දේ සිදුවී තිබේ. ඒ ගැන අප ඉතා සතුටට පත්වෙමු.

සෑම වසරකදීම, රජය මගින් පවත්වනු ලබන, විභාගයෙන් අපගේ පාසලේ ළමුන් ඉතා ඉහළ මට්ටමෙන් සමත් වෙති. මේ වසරේදී මේ පාසලහි ඉගෙනුම් ලබන්නාවු සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිසා ඔබ කරන්නාවු යාච්ඤාව අපි අගය කරමු.

තවද භාෂා 16 කින් අප නිකුත් කරන්නාවූ මේ සඟරාව නිසාත් අපගේ සියලු සභාවන් නිසාත්, නෙහෙමියා බයිබල් විදුහල නිසාත් අපගේ අනෙකුත් සියලුම සේවාවන් නිසාත් අපි ඔබට ප්‍රේම කරමු. ඔබ උදෙසා යාච්ඤා කරමු.

දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ සේවක,**
**එස්. සෑම් සෙල්ව රාජ්**




**CHIEF EDITORS**
Pastor S. Sam Selva Raj
Angeline Selvakumari Henry, M.A., M.Ed.

**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**
Bro. N. Prakasam, M.A., General Manager

**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M. Phil., B.Ed.

**ADVISORY BOARD**
Adv. Jose Abraham
Adv. N. Balaji, B.Com., B.L.
Dr. S. Rabinder Boaz, M.S.
Er. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM)
Aud. K. Puratchivendan, M.Com., B.L.
Bro. Rajeswaran Samuel, B.Com.

**PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
**Echo of His Call Printers**
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
**Phone :** (+91-44) 2852 8282
2852 9293, 2854 7766
**Email :** sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
**Websites :**
www.echoofhiscall.org
www.echoofhiscall.com

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners Village English High School Crusades 24 Hour Prayer Ministry Community Development

*1 වෙනි පිටුවෙන්....*

***2 පිටුවෙන්....(කතෘ වැකිය ඉතිරි කොටස)***

ඇති නමුත් ඔබගේ අනාගතය ඔබට නැති වී නැත. යේසුස්වහන්සේ ඔබට තබා තිබෙන්නාවූ ආශිර්වාද අත්පත් කරගන්න. ඔබ ඉදිරියට පැමිණ සූදානම් වෙන්න.

මීට වසර 50කට පෙර දී මා මාගේ ජීවිතයේ ද මෙවැනිම වූ අත්දැකීම් තුළින් ගමන් කළෙමුව. මාගේ නෑදෑයින් හා යහළුවන් අතර සිටි සමහරු බීමත්කමටත් මත්ද්‍රව්‍ය වලටත් ඇබ්බැහි වී සිටියෝය. තවද මාංශයේ තෘෂ්ණාවලට අසු වී සිටියේය. ඔවුන් බොරුවෙන් ජීවත් විය. අනෙක් අයව මහත් අපහසුතාවයට පත් කළේය. මුදලට ආශා වී දේව වචනය පසකට දැමුවේය. මාද එවැනි තත්ත්වයක සිටියේය. නමුත් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ කරුණාව කරුණාකොටගෙන මාව ගැළවීමට ගෙන ආවේය.

මාගේ මිත්‍රයෙකු වූ ජී. ජෙයරාජ් පෝල්මනි මට පත්‍රිකාවක් දී එය කියවන්නය කියා මා හට පවසනු ලැබුවේය. මා එම පත්‍රිකාව විනාඩි 2 කින් කියවා හමාර කළේය. එහි තිබූ පණිවිඩය නම්, ''දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරයි'' යනුවෙනි. මෙම පණිවිඩය මාගේ මනස ඇද ගත්තේය. නැවත නැවත මා එය කියෙව්වා. අපගේ ස්වාමීන්වහන්සේ යහපත හා නපුර කුමක්ද කියා අපගේ ස්වාමීන්වහන්සේ අපට තේරුම් කර දෙන බව මා පැහැදිලිවම දැන ගතිමි. එබැවින් මා යහපත් දේ ගැන සෙවීමට පටන් ගත්තෙමි. එවිට දෙවියන්වහන්සේ මාගේ ජීවිතය තුළ ක්‍රියා කිරීමට පටන් ගත්තේය. ''***නුමුත් ස්වාමීන්වහන්සේ භක්තිවන්තයා තමන්ටම වෙන්කරගත් බව දැනගනිව්....'' (ගීතාවලිය 4:3)*** මා මාගේ හදවතත් අනාගතයත් උන්වහන්සේට භාර දුනිමි. මාගේ ඇතුළාන්තයට මහත් ප්‍රීතියක් දැනුනි.

***''මාගේ ප්‍රේමවන්තයා සුදුය, රතු කම්මුල් ඇත්තේය. දස දහසක් අතරේ උතුම්ය. ඔහුගේ හිස ඉතා පවිත්‍ර රත්රන් මෙන්ය. ඔහුගේ කෙස් රොද ඝනය, කපුටුවා මෙන් කළුය. ඔහුගේ ඇස් දිය දොළවල් ළඟ ඉන්න පරෙවියෙක් වැනිය. කිරෙන් සේදී, හොබනා ලෙස පිහිටා තිබේ. ඔහුගේ කම්මුල් සුවඳ ගස් පාත්තියක්ද සුවඳ පැළ ඇති ගොඩැලිද මෙන්ය. ඔහුගේ තොල් මානෙල් මෙනි, දියවර ගන්ධරස එයින් වෑහෙන්නේය. ඔහුගේ අත් ලගුනිය මැණික් ඇල්ලූ රන්මුදු වැනිය. ඔහුගේ ඇඟ නීලමාණික්‍ය වලින් සැරසූ ඇත් දත් කර්මාන්තයක් මෙන්ය. ඔහුගේ කොණ්ඩා අමිශ්‍ර රන් අඩි පිට පිහිටා තිබෙන සුදු ගල් කණු මෙන්ය. ඔහුගේ ස්වරූපය ලෙබනොන් හා සමානය. කිහිරි ගස් මෙන් උතුම්ය. ඔහුගේ මුඛය ඉතා මිහිරිය. එසේය, ඔහු මුළුමනින්ම ප්‍රියකරුය. යෙරුසලමේ දූවරුනි, මාගේ ප්‍රේමවන්තයා මේ ආකාරය. මාගේ මිත්‍රයා මෙබන්දෙක්ය'' (සාලමොන්ගේ ගීතිකා 5:10 -16)***

මා යේසුස්වහන්සේව මාගේ ශුද්ධ වූ මිත්‍රයෙක් ලෙස පිළිගත්තෙමි. උන්වහන්සේ මාගේ ගැළවුම්කාරයා ලෙස මගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් කළේය.

මා කථා කිරීමට හා ඉගෙන ගැනීමට අදක්ෂයෙක් විය. මට මුදල් තිබුණේ නැත. නමුත් යේසුස්වහන්සේ මාව වෙනස් කළේය. අද මට කිසි හිඟයක් නැත. මේ යේසුස්වහන්සේ ඔබවත් උසස් කිරීමට පුළුවන. උන්වහන්සේ වෙතට එන්න. සැබවින්ම උන්වහන්සේ ඔබව උසස් කරන සේක.

දෙවියන්වහන්සේ කැමතිවන දේ ඔබ තෝරාගත් විටදී මිනිස් සමාජයට උන්වහන්සේ දුන්නාවූ මේ අනර්ඝ ආශිර්වාදය ඔබටද අත්පත් කර ගැනීමට පුළුවනි.

ඔබගේ අතීත ජීවිතය තිත්ත හා අමිහිරි අත්දැකීම් තුළින් ගමන් කළ නිසා ඔබගේ අනාගතය ගැන ඔබට භයක් ඇත. භිය නොවන්න. ඔබට සුභ පණිවිඩයක් තිබේ. ඔබට ඔබගේ අනාගතය කෙසේද කියා තෝරා ගැනීමක් තිබේ. ඔබට සාමකාමී අනාගතයක් අවශ්‍යද? එනම්, එය ඔබ සතුව ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේ මේ සම්බන්දව ඔබට කීප වතාවක් කතාකර ඇත. අද දවසේදී දෙවියන්වහන්සේට කීකරු වී කැප වීමක් කර තීරණයක් ගන්න. තීරණය ඔබ සතුය.

***''අද මා විසින් නුඹට අණකරන මේ ආඥාව නුඹට අමාරු වැඩි වූ එකක්වත් දුරව තිබෙන එකක්වත් නොවේ. අප විසින් එය පවත්වන පිණිස අප උදෙසා මූදෙන් එතෙරට ගොස් එය අපට ගෙනත් අපට ප්‍රකාශ කරන්නේ කවරෙක්දැයි නුඹ විසින් අසන්ට ඕනෑවන හැටියට එය මුහුදෙන් එතර තිබෙනවාත් නොවේ. නුමුත් වචනය ලෙස නුඹ කරන පිණිස එය නුඹට ඉතා ළංව නුඹේ මුඛයේද සිතේ ද තිබේ. (ද්විතීය කතාව 30:11-14)***

ඔබගේ අනාගතය රඳා පවතිනුයේ ඔබ ප්‍රකාශ කරන්නාවූ වචන මතය ද්විතීය කථාව 30:20 හි දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේ කරන්න යන්නාවූ ආශිර්වාදමත් අනාගතය ගැන සඳහන් කරයි. ''***.... නුඹේ දෙවිවූ ස්වාමින් වහන්සේට ප්‍රේමකොට, උන්වහන්සේගේ හඬට කීකරු වී,***

***උන්වහන්සේට ඇලුම්ව සිටපන්න. මක්නිසාද නුඹේ ජීවනයත් නුඹේ දවස්වල වැඩිවීමත් එයයි කීවේය''***

**(1) ඔබගේ ස්වාමින්වහන්සේට ප්‍රේමකරන්න.**

අද ලෝකයේ ප්‍රේමය කියන්නාවූ දේ බොහෝ දෙනාගේ ජීවිතයේ වැරදි ස්ථානවල තබා තිබෙනවා එනම්, මාංෂයේ තෘෂ්ණාව, ඇස්වල තෘෂ්ණාව හා ජීවිතයේ උඩඟුකම තුලය. ***''පියවරුනි, නුඹලාට ලියා එවුවේ, නුඹලා පටන්ගැන්මේ සිට සිටින්නාවූ තැනැන්වහන්සේට අඳුනන බැවින්ය. නුඹලා ශක්තිමත් බැවිනුත් නුඹලා තුළ දෙවියන්වහන්සේගේ වචනය පවතින බැවිනුත් නපුරාගෙන් නුඹලා ජයගත් බැවිනුත්ය. ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවල්වලටවත් ප්‍රේම නොකරල්ලා. යමෙක් ලෝකයට ප්‍රේමකෙරේනම්, පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත. මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංශයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ. ලෝකයත් ලෝකයේ තෘෂ්ණාවත් පහව යන්නේය. නුමුත් දෙවින්වහන්සේගේ කැමැත්ත කරන්නා සදාකාලේටම පවතින්නේය.''*** *(1 යොහාන් 2:14-17)*

අද ලෝකයෙහි සැම තැනම තිබෙන්නාවූ ප්‍රවෘත්තිය නම්, මිණීමැරීම්, හොරකම්, දූෂණ කිරීම් , ආර්ථික අපරාධ ආදී දේ සාමාන්‍ය මනුෂ්‍ය ජීවිතයට බලපැම් ඇති කර තිබේ. මේ සියල්ල සිදුවන්නේ මනුෂ්‍යයා තම ජීවිතය වැරදි ස්ථානවල තබා තිබෙන නිසාය. අද මනුෂ්‍යයා දෙවියන්වහන්සේ ගැන නොසිතා ක්‍රියා කරති. ඔවුන් අද මැවුම්කාරයාව අමතක කර දමා මැවීම කෙරෙහි විශ්වාසය තබා ජීවත් වෙති. දේව වචනයෙහි මෙසේ පවසයි. ***''තවද නුඹේ යෞවන දවස්වලදී නුඹේ මැවුම්කාරයා සිහිකරපන්න. මක්නිසාද විපත්ති දවස් පැමිණෙන්නේය. මට ඒවා ප්‍රිය නැතැයි නුඹ කියන දවස් ද ළංවන්නේය.''*** *(දේශනාකාරයා 12:1)* අද මනුෂ්‍යා මැවුම්කාරවූ දෙවියන්වහන්සේ අමතක කර දමා තිබෙන බැවින් ලෝකය මෙවැනි වු අපරාධී සිදුවීම් වලට මුහුණ දෙනු ලබති. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක. ***''නුමුත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ද සොයාපල්ලා, මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33)***

ඔබ ඔබගේ ජීවිතයේ කරන්නාවූ සියලු දේ තුළින්ම දෙවියන්වහන්සේට මුල්තැන දෙන්න. එවිට ඔබගේ ජීවිතයෙහි හාස්කම් හා ආශ්වර්‍ය්‍යමත් දේ දකිනු ඇත.

මෙය ලියන්නාවූ මාද මාගේ ජීවිතයෙහි මෙවැනි දේ අත්දැක්කෙමි. මගේ ජීවිතයේ සියලු දේ තුළින්ම මා ස්වාමින්වහන්සේට මුල්තැන දී ඇති බව පැවසීමට හැකිය. දෙවියන්වහන්සේ මාව දහස් ගණන් සෙනඟට ආශිර්වාදයක් වීමට පාවිච්චි කරන්නේය. ඔබත් ඉදිරියට පැමිණෙන්න.දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් තබා තිබෙන්නාවූ කිසිම දෙයක් ඔබට නොදී නොසිටින්නේය. දෙවියන්වහන්සේ ආශිර්වාද කරමින් ඔබද ඔබගේ පරම්පරාවටද දියුණුවෙන් දියුණුවට පත් කරන්නේය. මාංෂයේ තෘෂ්ණාව පස්සේ යන්නාවූ අප ඔවුන්ගේ ජීවිතය විනාශ කරගන්නේය.

නුමුත් දෙවියන්වහ්නසේගේ ප්‍රේමය පසු පස යන්නාවූ අය ඔවුන්ගේ ජීවිතයේ ජීවනය හා ආශිර්වාදය ලබා ගන්නේය. යේසුස්වහන්සේ මෙන් මේ ලෝකයේ යහපත් කිසිදු මනුෂ්‍යයෙක් අපට නැත.

අද තවත් බොහෝ දෙනෙක් දුක් විදිනු ලබන්නේ පාපය නිසාත් ඇස්වල තෘෂ්ණාව නිසාත් මුදලට තිබෙන්නාවූ ආශාව නිසාත් ඔවුන් සිටින්නාවූ ස්ථානයෙන් එළියට ඒමට බැරිය. ඔවුන්ගේ පාපයේ තෘෂ්ණාවන් සම්පූර්ණ කර ගැනීම පිණිස රූපවාහිණිය, අන්තර්ජාලය, දුරකථනය ආදී දේ ඔවුන්ගේ ජීවිතයේ වීරයාය කියා සිතන්නාවූ අයගේ ක්‍රීයාවන් සියල්ලම අනුගමනය කරති. අවසානයේදී ඔවුන් නොයෙකුත් වැරදි ක්‍රියාවන් වලට අසුවී හිර ගෙදරින් නතර වෙති.

අද ඔබගේ ප්‍රේමය තිබෙන්නේ කොහේද ? එය ස්ථානයක තබා තිබෙන්නේ ? ඔබගේ ක්‍රියාවන්ට දෙවියන්වහන්සේ දඬුවම් කර ඔබව ස්වාමින්වහන්සේ වෙතට ඇද ගන්නා විට ඔබ ස්වාමින්වහන්සේගේ ශුද්ධවූ මුහුණ දකින්නේය.

මාංෂයේ තෘෂ්ණාව ජීවිතයට ඉතාම හානිදායකය. උඩඟුකමින් හැසිරෙන්නන්ට දෙවියන්වහන්සේ ප්‍රිය නැත. *(යාකොබ් 4:6)* අද සමහරු තමාගේ ජීවිතය ගැනම උඩඟු කමින් පාරට්ටු කර ගනිති. නුමුත් දෙවියන්වහන්සේ යටහත් පහත් අයට කරුණාව දෙන්නේය. *(යාකොබ් 4:6)* ***''ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටත් ප්‍රේම නොකරල්ලා යමෙක් ලෝකයට ප්‍රේම කෙරේ නම්, පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත''*** *(1 යොහාන් 2:15)*

*6 වෙනි පිටුවෙන්....*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**පෙබ : 19-** දේවස්ථානවල කැපවුන සේවකයන් සහ ඔවුන්ගේ එකමුතුකම ගැන ස්තුති කරන්න.

**පෙබ : 20-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' පුවත් පත් සේවයට සැම ආකාරයෙන් උපකාර කරන සැම දෙනා ගැන ස්තුති කරන්න.

**පෙබ : 21-** ''කැඳවීමේ ප්‍රතිරාවය'' පුවත් පතේ පාඨකයන් ගැන ස්තුති කරන්න.

**පෙබ : 22-** කිතුනු ලේඛක ලේඛිකාවන් ගැන ස්තුති කරන්න.

**පෙබ : 23-** සැම කිතුනු සේවයකටම ලැබෙන දේව අනුග්‍රහය ගැන ස්තුති කරන්න.

**පෙබ : 24-** රෝහල් සේවය ගැනත්, දිව්‍යමය සුවය ගැනත් ස්තුති කරන්න.

**පෙබ : 25-** භාෂා 16 කින් මුද්‍රනය කරන ''කැඳවීමේ ප්‍රතිරාවය'' පුවත් පත් සේවය ගැන ස්තුති කරන්න.

**පෙබ : 26-** යාච්ඤා මැදිහත්කරුවන්ගේ බලවත් සේවය ගැන ස්තුති කරන්න.

**පෙබ : 27-** කිතුනු ප්‍රාදේශීය සභා හා ගෘහ සභා සේවයේ වර්ධනය වීම ගැන ස්තුති කරන්න.

**පෙබ : 28-** සීමාවක් පැමිනි කල, කිතුනු රාජ්‍යයේ වේගවත් වර්ධනය වීම ගැන ස්තුති කරන්න.

**පෙබ : 29-** දේව ධර්ම පාඨමාලාවක් පිලිබඳවත් ඒවායේ වර්ධනය පිලිබඳවත් ස්තුති කරන්න.

**2020 මාර්තු මාසය**

**මාර් : 01-** පෙබරවාරි මාසය උදෙසා දෙවිඳුන්ගෙන් ලැබුනු ආශිර්වාද ගැන ස්තුති කරන්න.

**මාර් : 02-** ශාඛා සභා රෝපනය කරන සැම ප්‍රධාන දේවස්ථානයක් ගැන ස්තුති කරන්න.

**මාර් : 03-** ළමා සේවයන් පිලිබඳවත් දරුවන් ශුද්ධාත්මයෙන් පූර්ණ වීම ගැනත් ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මාර් : 04-** 'කැඳවීම ප්‍රතිරාවය' සේවයේ සියලුම මූල්‍යමය අවශ්‍යතා ගැන ස්තුති කරන්න.

**මාර් : 05-** ධර්මදූත සේවකයන් හා මිෂනාරිවරුන් ගැන යාච්ඤා කරන්න.

**මාර් : 06-** මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින අයට පියවී සිහි කල්පනාව ලැබෙන ලෙස යාච්ඤා කරන්න.

**මාර් : 07-** ශ්‍රී ලාංකික තරුණ තරුණියන් වඩ වඩාත් දෙවිඳුන්ට ලංවීම ගැන යාච්ඤා කරන්න.

**මාර් : 08-** ප්‍රබල යාච්ඤා මැදිහත්කරුවන් බිහිවන පිණිස යාච්ඤා කරන්න.

**මාර් : 09-** දේවස්ථානවල පිහිටුවා ඇති ගිහි පාලක කමිටුවල යහපත් සේවය ගැන යාච්ඤා කරන්න.

**මාර් : 10-** දෙවිඳුන්ගේ සාමය ලෝකයේ සැම තැනකම අත්දකින ලෙස යාච්ඤා කරන්න.

**මාර් : 11-** බයිබල් විදුහල්වල ඉගෙනීම ලැබීමට මේ වසරේ ඇතුල්වන සිසු සිසුවියන් ගැන යාච්ඤා කරන්න.

**මාර් : 12-** සැම දේශයකටම මහත් පිබිදීමක් බලාපොරොත්තුවෙන් යාච්ඤා කරන්න.

**මාර් : 13-** කුඩා දරුවන්ව අපයෝජනය කිරීමෙන් ආරක්ෂා කරන මෙන් දෙවිඳුන්ට කන්නලව් කරන්න.

**මාර් : 14-** දේශපාලන නායකයන්ට ගැලවීමේ ආශර්වාදය දෙවිඳුන්ගෙන් පැමිණෙන ලෙස යාච්ඤා කරන්න.

**මාර් :15-** ඊශ්‍රායලයේ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

**මාර් : 16-** ත්‍රස්තවාදී සංවිධානවලට සම්බන්ධ වී සිටින අයගේ ගැලවීම උදෙසා යාච්ඤා කරන්න.

**මාර් : 17-** ස්වර්ගික ප්‍රඥාව සහ එළිදරව්ව සැම දේව දරුවෙකුටම ලැබෙන ලෙස යාච්ඤා කරන්න.

**මාර් : 18-** පාලක සැම් සෙල්වරාජ් ඇතුලු පවුලේ සැවොම නපුරු බලවේගවලින් ආරක්ෂා කරගන්නා ලෙස යාච්ඤා කරන්න.

4 වෙනි පිටුවෙන්.....

***2. යේසුස්වහන්සේගේ හඬට ඇහුම්කන් දෙන්න.***

මනුෂ්‍යයා තුළින්ද මාධ්‍ය තුලින්ද හා මුද්‍රිත පත්‍රිකා තුළින්ද යේසුස්වහන්සේ ඔබට කතා කරයි. උන්වහන්සේ ඔබට නව ජීවිතයක් දීමට කැමතිය. ***''වෙහෙසවෙන්නාවූ බර උසුලන්නාවූ සියල්ලෙනි මා වෙතට වරෙල්ලා මම නුඹලාට සහනය දෙමි.'' (මතෙව් 11:28)***

අද බොහෝ දෙනා මුලාවී සිටිනු ලබන්නේ තමා දෙවියන්වහන්සේගේම නියෝජිතයෙක්ය කියා කියන්නාවූ පුද්ගලයන් පසුපස ගමන් කිරීමයි නමුත් යේසුස්වහන්සේව අනුගමනය කලාවූ කිසිවෙකුටවත් වැරදි ***''මම යෞවනව සිටියෙමි, දැන් මහළුව සිටිමි, එසේ වී නමුත් මනුෂ්‍යයා අත්හරිනු ලැබූ බවත් ඔහුගේ වංශය කෑම සිගනබවවත් නුදුටිමි.'' (ගීතාවලිය 32:25)***

***''බලවතුන්ගේ පුත්‍රයෙනි, ස්වාමීන්ට දෙව්, මහිමයත් බලයක් ස්වාමීන්ට දෙව්. ස්වාමීන්ගේ නාමයට දියයුතු මහිමය දෙව්, ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමීන්ට ප්‍රශංසා කරව්. ස්වාමීන්ගේ ශබ්දය ජල මතුයෙහිය. මහිමයෙන් යුක්තවූ දෙවියන්වහන්සේ, එනම් ජල රාශි මතුයෙහි වැඩ සිටින ස්වාමීන්වහන්සේ ගර්ජනාකරන සේක. ස්වාමීන්ගේ ශබ්දය බලවත්ය. ස්වාමීන්ගේ ශබ්දය මහිමයෙන් පූර්ණය. ස්වාමීන්ගේ ශබ්දය කිහිරිගස් බිඳියි. එසේය, ස්වාමීන්වහන්සේ ලෙබනොන්හි කිහිරිගස් කැබෙලිකොට බිඳිනසේක. උන්වහන්සේ ඒවා වස්සෙකු මෙන්ද ලෙබනොන් සහ සිරියොන් කඳු තරුණ වල් ගොනෙකු මෙන්ද පෙංකෙලින්ට සලස්වනසේක. ස්වාමීන්ගේ ශබ්දය ගිනිදැල් බෙදයි. ස්වාමීන්ගේ ශබ්දය වනාන්තර සොලවයි. ස්වාමීන්වහන්සේ කාදෙෂ් වනාන්තරය සොලවනසේක. ස්වාමීන්ගේ ශබ්දය මුවදෙනුන් ප්‍රසවකරවයි. වනය පාළුකරයි. උන්වහන්සේ මාලිගාවෙහි සියල්ල: මහිමය වේවා කියයි ස්වාමීන්වහන්සේ ජලගැල්මෙහිදී රජෙකු මෙන් වැඩහුන්සේක. එසේය, ස්වාමීන්වහන්සේ රජෙකු මෙන් සදාකල් වැඩහිඳිනසේක. ස්වාමීන්වහන්සේ තමන් සෙනඟට ශක්තිය දෙනසේක. ස්වාමීන්වහන්සේ තමන් සෙනඟට සමාදානයෙන් ආශිර්වාදකරනසේක. (ගීතාවලිය 29:1-11)***

යේසුස්වහන්සේ ඔබට ආදරයෙන් කථා කරයි. මේ නව වසරේ ඔබට නව ජීවිතයක් දීමට උන්වහන්සේ කැමතියි. මේ නව වසරේ ඔබගේ හදවත කැමැති දොරටුවට උන්වහන්සේ තට්ටු කරන සේක.

උන්වහන්සේට ඇහුම්කන් දෙන්න. ඔබ දීර්ඝ කලක සිට කිතුණුවෙක් වෙන්නට පුළුවනි. නැතිනම් ඔබ දෙවියන්වහන්සේට සේවය කරනවා විය හැක. ඔබ හොඳ සම්මාදමක් දෙන කෙනෙක් විය හැක. එහෙත් දෙවියන්වහන්සේ අපට පවසන්නේ ඔබගේ කුළුදුල් ප්‍රේමය නැතිව සිටින බවයි. ***(එළිදරව් 2:4)***

අද බොහෝ අයගේ යාච්ඤා ජීවිතය අඩු වී ජීවිතයේ පවිත්‍ර බව අඩු වී මුදල් ගණුදෙනු අතින් අවංකභාවයද නැති වී ඇත. මෙවැනි දේ තිබේනම් වහාම අත්හරින්න. මන්ද දෙවියන්වහන්සේ ඔබ නොදන්නාවූ දවසකදී පැමිණෙනු ඇත. ***''මක් නිසාද රාත්‍රියෙහි සොරෙකු එන්නාක් මෙන් ස්වාමින්වහන්සේගේ දවස පැමිණෙන බව නුඹලාම හොඳ හැටි දනිහුය.'' (1 තෙසලෝනික 5:2)*** යේසුස්වහන්සේ පැමිණි පසු ඔබට පසුතැවිලි වීමට අවස්ථාවක් නොමැත. ඉන්පසු ස්වාමින්වහන්සේ මේ ලෝකය විනිශ්චය කිරීම පිණිස ශුද්ධවූ සිංහාසනය මත වාඩිවෙන්නේය. එසේනම් උණ්වහන්සේ ළඟට විත් ජීවත් වන අය ආශිර්වාද ලද්දෝය.

ඔබ මේ ලෝකයට ඉදිරියේදී සිදුවෙන්නට යන්නාවූ දේ ගැන කියවන්න. ***(එළිදරව් 20:11-15)***

***''එම්බා ඉශ්‍රායෙල් නුඹ වාසනාවන්තය, ස්වාමින්වහන්සේ විසින් මුදන ලද සෙනඟක් වූ නුඹට සමාන කවුද? උන්වහන්සේ නුඹට උපකාර කරන පලිහත් නුඹේ මහිමයේ කඩුවත්ය. නුඹේ සතුරෝ නුඹට යටත් වන්නෝය. නුඹද ඔවුන්ගේ උසස්ථාන පාගන්නෙහියයි කීය. (ද්වීතිය කථාව 33:29)***

**(3). ස්වාමීන්වහන්සේට ඇලුම්ව උන්වහන්සේට ඔබගේ ජීවිතයෙහි මුල්තැන දෙන්න.**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ඇලුම්වී ජීවත්වෙමින් දීර්ඝායුෂද මිහිරිමත් ඵලදායි ජීවිතයක්ද ලැබෙනු ඇත. මා මෙය ඔබට පවසන්නේ එම ජීවිතයේ රහස මා අත්විඳ තිබෙන නිසාය. මේ අවස්ථාව ඔබට අහිමි වුවහොත් ඔබ ඔබගේ ජීවිතයේ පරාජිතයෙක් වනු ඇත. යේසුස්වහන්සේ දෙන්නාවූ ජයග්‍රාහී ගැලවීමේ ජීවිතය ඔබ නොපිළිගතහොත් ඔබට දුක් වේ. එමනිසා යේසුස්වහන්සේ වෙතට එන්න කදිම අවස්ථාව දැන්ය. ඔබ ආශිර්වාද ලද්දෙක් වෙනු ඇත. ඔබගේ මුළු ජීවිතයම ස්වාමීවු යේසුස්වහන්සේට

කැපකරන්න. උන්වහන්සේ ඔබට ආශිර්වාද හා දීර්ඝායුෂය දෙනු ඇත.

## එකිනෙකාව සනසන්න.

අප අපගේ සමාජය තුල සැනසීමත් නොමැතිව බොහෝ දෙනෙක් සිටී. සනසන්න ඕන අය සනසන්නේ නැතිව ඔවුන්ව පාලනය කිරීමට උත්සාහ කරයි. දිළිඳු මනුසයා පොහොසත් මනුෂ්‍යයෙකු වෙතට මුදල්මය ආධාර ලබා ගන්නා පිණිස පැමිණි විට ඔහුට එරෙහි වී කෑ ගසා ඔහුව පන්නා දමනු ඇත. නුගත් තමාගේ ජීවිතයට මනුෂ්‍යා යමක් ලබා ගැනීම පිණිස රැකියාවක නිරත වන විටදී ඔහුව රැවටීමක් ලක් කරයි. රෝගාතුරුව ඇදෙහි වැතිර සිටින්නාවූ අයට සැනසීමක් අවශ්‍ය වේලාවේදී ඔහුට රළු පරුෂ වචන පවසා ඔහුගේ රෝගී තත්වය තිබුනාටත් වඩා උත්සන්න කරනු ඇත.

මෙවැනි අයට දේව වචනය පවසන්නේ, ''සහාවේ රැස්වීම'' මෙවැනි අයට සැනසීමක් ලබා දෙන්නාවූ ස්ථානයක් බවයි. දේව වචනය තුලින් පාවුළු තුමා එකිනෙකාව සනසන්න' ය කියා උගන්වයි. *(1 **තෙසලෝනික** 4:18)* මෙමගින් ඔහු අපට අණකරනවා පමණක් නොව එකිනෙකාව සනසන්න'ය කියාද පවසයි.

මේ කොටස තුලින් මා ප්‍රධාන කාරණාවන් 3 ක් පැවසීමට කැමැත්තෙමි. *(1 **තෙසලෝනික** 4:16-18)* මෙහි සඳහන්ව තිබෙන පදයේහි මෙම වචනයෙහි ඉතා ගැඹුරු අර්ථයක් තිබේ.

**(1). යේසුස්වහන්සේ තමාවම යටහත් කරගත්තේය.**

**පළමු ශ**තවර්ෂයේදී හෙරෝද් රජතුමා විසින් කිතුණුවන්ට පීඩාවට පත්කරනු ලැබුවේය. බොහෝ දෙනෙක් වේදසාක්ෂිකාරයන් ලෙස මිය ගියේය. එම කාල වකවානුව තුලදී ඇදහිලිවතුන් දියුණුවීමේ ආශිර්වාදය තුල ජීවත්වූයේ නැත. පේතෘස්, යොහාන් හා පාවුල්ද මේ කාරණා උගන්වන්නේ නැතිව ''මරණාතා'' හෙවත් 'යේසුස්වහන්සේ ඉක්මනින් එනවා'ය කියන කාරණාව ගැන ඉගැන්වීය. මේ කාරණය නිසා මුල් කාලයේදී කිතුණුවෝ පාපයෙන් තොර පවිත්‍ර වූ ජීවිතයක් ගතකරමින් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත් විය. ඔවුන් මේ ලෝකය තුලින් ලැබූ ආශිර්වාද වලට වඩා ස්වර්ගයෙන් ලැබෙන්නාවූ ආශිර්වාදය දෙස බලා සිටියේය. දිගටම ඔවුන් සභාව තුල රැස්වී ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කලේය. ඔවුන් අමාරුකම් හා වේදනාවන් තුලින් ගමන්කරන විටදී ඔවුන්ට මෙසේ කීමට හැකිවිය. ***''මක්නිසාද මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස්වහන්සේ උදෙසාය. මරණයද මට ලාභයක්ය.'' (පිලිප්පි 1:21)*** ඔවුන් බොහෝ ප්‍රශ්නවල මුහුණදුන් විටදී මෙසේ පැවසුවේය. ***''මම තවමත් අල්ලාගත්තෙමියි නොසිතමි. නුමුත් එකක් කරමි. එනම්, පස්සෙන් ඇති දේ මතකනැතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යමින්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිණුම්පළ කරා දුවමි.'' (පිලිප්පි 3:13-14)***

රෝගයකින් සුවය ලබා ගැනීමට පුළුවන් වූ නමුත් අවසානය එය නොවෙයි. වර්ෂාවකට පසුව නැවත නැවතත් වළාකුළු පැමිණෙනවාක් මෙන් අපගේ ශරීර තුලටද එක් රෝගයකින් සුව වූ පසු තවත් රෝගයක් වැළඳීමට පුළුවනි. තව කෙනෙක්

*8 වෙනි පිටුවට...*


**ඔබගේ කරුණාවන්ත අවධානය සඳහා**

**කැඳවීමේ ප්‍රතිරාවය** තුළින් සිදුවන විවිධාකාර සේවයන්, දෙවියන්වහන්සේගේ සේවයන් යයි ඔබ විශ්වාස කරනවාද?........................

කුමන ආකාරයකින් හෝ, **කැඳවීමේ ප්‍රතිරාවය** හි සේවයන්ට දායක වීමට ඔබ කැමති වන්නේද? ......................................................................

ඔබගේ මහත් සැලකිලිවන්ත යාච්ඤා තුළින් මෙම සේවයන් ඉදිරියේ **යාච්ඤා හවුල්කරුවකු** වීමට ඔබත් කැමතිද?............................

,**කැඳවීමේ ප්‍රතිරාවය,** සේවයන් හමුවේ, කුඩා මාසික දීමනාවකින් (මාස 12) ඇදහිල්ලේ පංගුකාරයකු වීමට, ඔබ අදහස් කරන්නේද?

..........................................................................................................................................................................................

කරුණාකර අපට ලියන්න.

**ECHO OF HIS CALL,**
10, Mohammed Abdullah II Street, Chepauk, Chennai - 600 005, India.
Ph.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766 Cell: (+91) 98410 71852.
**E-mail: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites: www.echoofhiscall.org / www.echoofhiscall.com**

ණය බරෙන් නිදහස ලැබුවා යැයි සිතුවද එය තාවකාලික විසඳුමක් පමණි. මෙය දැනගත් මුල් කාලයේ කිතුණුවෝ එකිනෙකාට පවසනු ලැබුයේ, 'මරණාතා' එනම්, ''යේසුස්වහන්සේ ඉක්මනින් පැමිණෙයි'' කියාය. මෙලෙස ඔවුන් පවසනු ලැබුයේ එකිනෙකාව සනසා ගන්නා පිණිසය.

අද අප අන් අයව සනසන්නේ කෙසේද? අද අප සැනසීමට පත්වෙන්නේ අපට තිබෙන්නාවූ ලෙඩ රෝග සුව වූ විටදී හෝ ණය බරෙන් නිදහස් වුනාමද? මේ සියල්ල යහපත් නමුත් මේ සියල්ලටම වඩා සදාකාලික ස්ථිර සැනසීමක් අපට තිබේ. එනම්, අපගේ ස්ථිර සැනසීම නම්, යේසුස්වහන්සේගේ දෙවන පැමිණීමයි. මෙම පණිවිඩය අන් අයට දෙමින් ඔවුන්වද සැනසීමට ගෙන එමු.

**(2). ක්‍රිස්තුස්වහන්සේ තුල මලාවූ අපි නැවත නැගිටින්නෝය. (1 තෙසලෝනික 4:6)**

මරණය සෑම මනුෂ්‍යයෙකුටම පැමිණෙන්නාවූ අමිහිරි අත්දැකීමකි. තමාගේ ප්‍රේමවන්තයන් අහිමිවූ විට එම අයව සනසන්නේ කෙසේද? යන්න අපටද මතුවන ගැටළුවකි. අප කෙනෙකුගේ අවමංගල්‍යයකට ගිය විටදී එහි සිටින ඔහුගේ ප්‍රේමවන්තයන්ට අප විවිධ වචන පවසා ඔවුන්ව සැනසීමට පත්කරමු. ඒවා යම්තාක් දුරට යහපත් වචන වුවත් ස්ථිරවූ සැනසීමේ වචන සඳහන් කර ඇත්තේ ශුද්ධ වූ පාවුළු තුමාගේ වචන වලය. හිතෝපදේශ 14:32 හි මෙසේ පවසා ඇත. ''....එහෙත් ධර්මිෂ්ඨයාට මරණයේදී ආරක්ෂාස්ථානයක් ඇත්තේය.'' සදාකාල ජීවනය ගැන ධර්මිෂ්ඨයාට ශක්තිමත් ඇදහිල්ලක් තිබේ. ඔහු මැරුණ පසු මළවුන්ගෙන් නැගිට ස්වාමීන්වහන්සේ සමඟ සදාකාලයටම ජීවත්වන්නේය. මෙම ප්‍රීතිමත් බලාපොරොත්තුව හදවතෙහි තබාගෙන පාවුළුතුමා මෙසේ පවසයි. ''*එම්බා මරණය තාගේ ජය කොයිද? එම්බා මරණය තාගේ කටුව කොයිද?'' (1 කොරින්ති 15:55)*

ස්වාමීන්වහන්සේ ඔබටත් මටත් පවසනුයේ, එකිනෙකාව සනසන්නාවූ අපිද සැනසීම දෙන්නාවූ සභාව තුල සිටිය යුතුය කියාය. අපි එකිනෙකාව සනසනවා නම් අපි ක්‍රිස්තුස්වහන්සේගේ සියලු ආශිර්වාදයන් භුක්ති විඳිමු.

**(3). අප නිතරම ස්වාමීන්වහන්සේ සමඟ වාසය කරමු.**

අපට තිබෙන්නාවූ ඉහළ බලාපොරොත්තු වල උසස්ම බලාපොරොත්තුව නම්, ස්වාමීන්වහන්සේ සමඟ සදාකාලයටම ජීවත් වීමයි. ශුද්ධවූ පාවුළුතුමාගේ විශ්වාසය නම්, ''*....මාගේ ආශාව නම්, තුරන්ව ගොස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ විසීමටයි, මක්නිසාද ඒක බොහෝසෙයින් වඩා හොඳය.'' (පිලිප්පි 18:23)*

තනිකමෙන් ජීවත් වෙන්නාවූ අය කිසි දිනක සැනසීමක් ලබා නැත. කිසි මනුෂ්‍යයෙක් අපට උපකාර කර නැත. නුමුත් ක්‍රිස්තුස්වහන්සේ එන කල අපි තනියම නොව උන්වහන්සේ සමග සදාකාලයෙන් සදාකාලයටම අපි ජීවත්වන්නේය. එය අපට සැනසිමක් ගෙන දෙන්නේය. අපට මේ ලෝකය තුළ කොතරම් ප්‍රශ්ණ හා කරදර තිබුණත්


## ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministry** is supported by the free-will offerings and donations of the God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us. Whenever you change your postal or e-mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our websites also. You can read it by going into the site as well as downloading it and get blessed.

Your letters, prayer requests and your financial helps (by D.D., Cheque, M.O. etc.) to **ECHO OF HIS CALL** may be sent to the address below.

Please send your **Land Phone / Cell Phone Numbers and E.mail addresses** for updation.



**ECHO OF HIS CALL**
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005, India.
Phone : (+91- 44) 2852 8282, 2852 9293, 2854 7766 Cell : (+91) 98410 71852
E-mails : sam@echoofhiscall.org / biblecor@yahoo.co.in Websites : www.echoofhiscall.org / www.echoofhiscall.com



# PIT TO PALACE
## පාලු වලකින් මාලිගාවට
## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

**"මක්නිසාද නුඹලාගේ වැඩයද නුඹලා ශුද්ධවන්තයන්ට කළාවූ, කරන්නාවූ උපස්ථානයෙන් උන්වහන්සේගේ නාමයට පෙන්වූ, ප්‍රේමයද මතකනැතිකරන්ට උන්වහන්සේ අධර්මිෂ්ට නැත. (හෙබ්‍රෙව් 6:10)**

1982 වන වර්ෂයේදී සේවය සඳහා මට බොහෝ ස්ථාන වලට ගමන්කිරීමට සිදුවිය. එමෙන්ම මගේ සභාවේ තිබූ සේවාවන්ද මා ඉදිරියෙහි තිබුණි. මෙවැනි අවස්ථාවේදී මගේ දකුණු අතෙහි ලොකු වේදනාවක් තිබුණි. මට කිසිවක් ලිවීමටද බැරිව සිටියෙමි. දිනපතා පැවරී තිබූ කාර්‍යයන්ද කිරීමට නොහැකිව සිටියෙමි. මගේ දකුණු අත මේසට මත තැබූවිට නැවත එම අත මට ගැනීමට සිදු වූයේ වම් අතෙහි උපකාරයෙනි. මගේ හැම වැඩකදීම මා අන් අය මත රැඳී සිටියෙමි.

මා සුවය සඳහා යාච්ඤා කලා පමණක් නොව ඒ උදෙසා ව්‍යායාමද කලෙමි. වසරක් පුරාම මේ වේදනා තත්වවය තිබූ නිසා මට කිසි බලාපොරොත්තුවක් නැහැ කියා මා සිතුවෙමි.

දිනක් එක් දේව දාසයෙක් ඔහුගේ බිරිඳ සමඟ මාව බැලීමට පැමිණියෝය. ඔහුගේ සේවයට මගෙන් උපකාර අවශ්‍යය කියා ඔහු ඉල්ලූ නිසා ඔහුව අපගේ සේවය සඳහා පාවිච්චි කිරීමට පටන්ගත්තෙමු. ඔහුගේ දේශනාවන් ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට මා පරිවර්තනය කල අතර තවත් බොහෝ ස්ථාන වලටද මා ඔවුන්ව ගෙන ගියෙමි. දෙවියන්වහන්සේ බලවත් ලෙස ඔවුන්ව පාවිච්චි කල අතර බොහෝ දෙනා ක්‍රිස්තුස්වහන්සේව පිළිගත්තේය. තවත් බොහෝ දෙනෙකුගේ කොන්දේ, ශරීරයේ තිබූ දිගුකාලීන වේදනාවන් වලින් නිදහස් වෙන බව මා දුටුවෙමි. තවත් අය අශුද්ධ ආත්ම වලින් නිදහස ලැබුවේය. නමුත් මගේ අතෙහි තිබූ වේදනාව හා අමාරුව මා ඔවුනට පැවසුවේ නැත.

මේ යුවල ඉතා මහලුව සිටි නිසා මට ඔවුන්ගේ බෑගය සහ මගේ බෑගය ඔසවාගෙන යාමට සිදු විය. මගේ අතෙහි තිබූ වේදනාවද සමඟ මා ප්‍රීතියෙන් එය ඉටු කලෙමි. බොහෝ අවස්ථාවන් වලදී එම මනුෂ්‍යයා මගෙන් මෙසේ අසනු ලැබීය. එනම්, ''සහෝදරයා, ඔබට මේ බෑග් තනියම ඔසවාගෙන යාමට පුළුවන්ද?'' යනුවෙනි. එවිට මා සිනාසී සිටියෙමි. දිනක් කේරළ ගිය විටදී සියලුම බෑග් බසය තුළට දමන අවස්ථාවේදී අපගේ බෑග් සහ අනෙක් අයගේ බෑග් සියල්ලම මා පිට වැටුණි. මාව බිමට ඇදගෙන වැටුණි. එවිට අනෙක් මගීන් කෑ ගසමින් මාව එසවූ බව තවමත් මාගේ මතකයේ රැඳී තිබේ. මගේ දකුණු අතෙහි තතිබූ වේදනාව දිනෙන් දිනහ වැඩි වන්නට විය. නමුත් මා මගේ සේවය කඩ නොකර දිගටම කරගෙන ගියෙමි.

අවසානයේදී එම දේව දාසයින් යුවල ඉන්දියාවෙහි ඔවුන්ගේ සේවය නිමා කරමින් ඔවුන්ගේ රටට යාමට ගියේය. මා ඔවුන්වගුවන්තොටුපොල වෙතට ගෙන ගොස් ඔවුන්ව ඇරලවා නැවත මා මගේ නිවසට එන අතර තුර වසරක් පුරා මගේ අතෙහි තිබූ වේදනාව නැතිව ගොස් එම මොහොතේම මට සුවය ලැබුණි. එම මොහොතේ සිට මගේ අත ඉතා නිදහස්ව ක්‍රියාත්මක කිරීමට හැකි විය.

මෙම හාස්කම සිදුවී දැනට වසර 30ක් ගෙවී හමාරය. ඉන්පසු කිසිම දිනෙක මට එම වේදනාව පැමිණුනේ නැත. මට පුදුම නිදහසක් ලැබුණි. මා මගේ ශාරීරික වේදනාව අමතක කර එම දේව දාසයාගේ සේවයට උපකාර කල විට ඔවුන් තුළ තිබූ සුව කිරීමේ ආලේපය මා තුලට පැමිණ මාව සුවපත් විය. ඉන්පසු කිසි දිනෙක මා එම දේව දාසයින්ව දුටුවේම නැත. ඔවුන්ගේ නම පමණක් මගේ මතකයේ පවතියි.

අද දෙවියන්වහන්සේ මට මහත් ලෙස ආශිර්වාද කර ඇත. බොහෝ පාලකවරුන් හා සේවකයින් මාව දරුවෙක් ලෙස බලා ගනිති. දෙවියන්වහන්සේ ඉතා හොඳින් මාව ආරක්ෂා කරයි. මට උදවු උපකාර කිරීමටද බොහෝ දෙනෙක් සිටිති. අද මා ලෝකයේ කුමන ස්ථානයකට ගියත් දෙවියන්වහන්සේගේ දරුවන් මට ඉතා හොඳින් සලකති.

මෙය කියවන්නාවූ සහෝදර සහෝදරිය, ඔබගේ සේවා ගමන ඉතා අමාරු හා දුෂ්කරද? ''දෙවියන්වහන්සේ මාව කුසගින්නෙන්, බොහෝ ප්‍රශ්න කරදර තුලින් හා විවිධ රෝග තුලින් තිබෙන්නේ ඇයි?'' කියා ඔබ සිතනවාද? අනෙක් දේව දාසයින් ඉතාම සුඛෝපබෝගී ලෙස ජීවත් වන විට මා පමණක් දුක් විඳින්නේ ඇයි? කියා සිතනවාද? ක්ලාන්ත නොවන්න. ඔබ කෙතරම් කුඩා සේවයක් කලත් කොතරම් ප්‍රශ්න වලින් ඔබ ගමන්කරනු ලැබුවවත් ඒ සියල්ල ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ පොතෙහි ලියනු ලැබේ. නියම කාලයේදී දෙවියන්වහන්සේ ඔවුන්ට ජීවනය ලබා දී ඔවුන් සියල්ලන්ටම ඔබව ආශිර්වාදයක් බවට පත් කරනු ඇත. ***''ස්වාමීන්වහන්සේ ගැන බලා සිටින්නන්ටත් උන්වහන්සේ සොයන ආත්මයටත් උන්වහන්සේ යහපත්ය.'' (විලාප ගී 3:25)***

RNI NO. TN/SIH/2006/17846

*9 වෙනි පිටුවෙන්...*

ක්‍රිස්තුස්වහන්සේ බලාපොරොත්තු වෙන්නාවූ ආකාරයෙන් ජීවත් විය යුතුයි. එවැනි ජීවිතයට සැනසීමක් සදාකාලයටම ක්‍රිස්තුස්වහන්සේ සමග ජීවත් වීමටත් ඉඩ ප්‍රස්ථාන ලබා දෙයි. සදාකාලයටම උන්වහන්සේ සමග සිටිනවාය යනු, ***''ඒනොක් දෙවියන්වහන්සේ සමග ඇවිද්දා'' (උත්පත්ති 5:24) ස්වාමින්වහන්සේට සමීපවීම මට යහපත්ය.'' ගීතාවලිය 73:28)*** ස්වාමින්වහන්සේට සමීප වීම ඔහුට තිබෙන්නාවූ තෘප්තියයි. කියා ඔහු ලියනු ලබයි. මරියාගේ ප්‍රීතිය වූයේ ඇය තුළින් යේසුස්වහන්සේ ගැලවුම්කරු ලෙස ඉපදෙන්නට යන නිසාය. ***(ලූක් 1:47)*** ඉතා මහත් සැනසීමනම් ක්‍රිස්තුස්වහන්සේව දැනගැනීමයි.

අද උන්වහන්සේ අපට මෙසේ පවසයි. ***''මෙන්න මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දොර ඇරියොත් ඔහු වෙතට ඇතුල්ව ඔහු සමග කෑම කන්නෙමි. ඔහු ද මා සමග කන්නෙමි.'' (එළිදරව් 3:20)*** මේ එළිදරව්ව ලබා ගත් අය සැනසීම ලබයි. සුලෙයිමිත්තිය කියන ආකාරයට ''ඔහු මිදි පැන් ගෙයට මා ගෙනා සේය. මට උඩින් ඔහුගේ කොඩිය ප්‍රේමයයි.'' (සාලමොන්ගේ ගීතිකා 2:4) අප ස්වාමින්වහන්සේගේ ප්‍රේමයේ ධජය යට ජීවත් වෙමු. එවිට අපට සැබැවින්ම සැනසීම ලැබේ.

Kindly Pray for **St. Paul's Matriculation School** and **Nehemiah Bible Colleges.**

## කරුණාකර අප ප්‍රධාන සභාවේ සේවාවන් උදෙසා යාච්ඤා කරන්න.

1. යාච්ඤා සේවය - පැය 24 පුරා
2. බයිබල් තැපැල් පාඩම් මාලාව - ඉංග්‍රීසි, දෙමල හා හින්දි
3. කැඳවීමේ ප්‍රතිරාවය - මාසික සඟරාවන්
   දෙමල, ඉංග්‍රීසි, මලයාලම්, තෙලගු, හින්දි, මරාති, කන්නඩා, බෙංගාලි, ගුජරාති, ඔරියා, නේපාලි, අසාම්, පංජාබි, උර්දු, සිංහල සහ අප්‍රිකානාස්
4. නෙහෙමියා බයිබල් විද්‍යාල
5. තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව - දෙමල සහ ඉංග්‍රීසි
6. පුහුණුවීමේ වැඩසටහන්
7. චිත්‍රපටි සේවය සහ ශුභ ආරංචි රැස්වීම්
8. ශුභ ආරංචි පත්‍රිකා මුද්‍රණය කිරීම - ප්‍රකාශනය කිරීම.
9. මුද්‍රිත සේවය පවත්වාගෙන යාම.
10. ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල
11. සබත් පාසල - ඉරිදා පෙ.ව 8.30
12. දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා පෙ.ව 5.00, 7.00 හා 10.00
13. තෙලෙගු භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 4.00
14. හින්දි භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 5.00
15. මලයාලම් භාෂාවෙන් දේව මෙහෙය- ඉරිදා ප.ව 5.00
16. ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් දේව මෙහෙය - ඉරිදා ප.ව 6.00
17. පත්‍රිකා බෙදා හැරීම. - ඉරිදා ප.ව 2.30
18. පාලක වරුන්ට උපදෙස් දීම. - ඉරිදා ප.ව 4.00
19. කාන්තා යාච්ඤාව - බදාදා ප.ව 5.30
20. සති මැද නමස්කාර දේව මෙහෙය
21. පුරුෂයින්ගේ යාච්ඤාව - සිකුරාදා ප.ව 8.00
22. සෙනසුරාදා දේව මෙහෙය - ප.ව 5.00
23. සේවකයින්ගේ රැස්වීම - සෙනසුරාදා ප.ව 6.00
24. ගෘහ රැස්වීම් - අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ප.ව 6.30
25. විශේෂ රාත්‍රි භෝජනය - පළමු ඉරිදා උදෑසන 5.30
26. දෙමාපියන්ගේ යාච්ඤාව - පළමු ඉරිදා ප.ව 4.00
27 උපවාස යාච්ඤාව - පළමු සෙනසුරාදා පෙ.ව 9.30
28. සර්ව රාත්‍රි යාච්ඤාව - දෙවෙනි සිකුරාදා ප.ව 9.30
29. ශුද්ධවූ රාත්‍රි භෝජනය - දෙවන ඉරුදින දේව මෙහෙය
30. දිනපතා උදෑසන දේව මෙහෙය - පෙ. ව 5.00
31. කාර්යාල මණ්ඩලයේ මෙනෙහි කිරීම - දිනපතා පෙ.ව 9.00
32. කාර්යාල සේවය - දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 9.00

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 3rd FEBRUARY 2020**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from Old No.18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers** Old No. 18, New No. 10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**